# මූලද්‍රව්‍ය හා සංයෝග ප්‍රමාණනය

1. පරමාණුක ස්කන්ධ ඒකකය අර්ථ දක්වන්න.

2. මෙම ප්‍රකාශනයේ හිස්තැන් සම්පූර්ණ කරන්න.

| |
|---|
| පරමාණුක ස්කන්ධ ඒකකය = ....................................................... ....................................................... |

3. සාපේක්ෂ පරමාණුක ස්කන්ධය අර්ථ දක්වන්න.

4. සාපේක්ෂ පරමාණුක ස්කන්ධය ප්‍රකාශනයක් මගින් දක්වන්න.

5. $^{12}C$ පරමාණුවේ ස්කන්ධය $1.99 \times 10^{-23}$g ද ($\sim 2 \times 10^{-23}$g), K පරමාණුවක ස්කන්ධය $6.476 \times 10^{-23}$g ($\sim 6.5 \times 10^{-23}$g) ද නම්, K වල සාපේක්ෂ පරමාණුක ස්කන්ධය ගණනය කරන්න.

6. සාපේක්ෂ අණුක ස්කන්ධය අර්ථ දක්වන්න.

7. $H_2O$ අණුවක ස්කන්ධය $2.99 \times 10^{-23}$g ($\sim 3 \times 10^{-23}$g) ද, $^{12}C$ පරමාණුවේ ස්කන්ධය $1.99 \times 10^{-23}$g ($\sim 2 \times 10^{-23}$ g) ද නම්, $H_2O$ සාපේක්ෂ අණුක ස්කන්ධය ගණනය කරන්න.

8. $H_2O$ වල සාපේක්ෂ අණුක ස්කන්ධය, සාපේක්ෂ පරමාණුක ස්කන්ධය ඇසුරෙන් ද ගණනය කරන්න. (H =1, O = 16)

9. ඇවගාඩ්රෝ නියතය අර්ථ දක්වන්න.

10. Mg = 24 නම්, Mg 12gක, 24gක හා 48gක ඇති Mg පරමාණු සංඛ්‍යාව වෙන වෙනම සොයන්න.

11. ද්‍රව්‍ය ප්‍රමාණය මැනීමේ අන්තර්ජාතික ඒකකය කුමක්ද?

12. “මවුලය” අර්ථ දක්වන්න.

13. Na=23 නම්, Na පරමාණු මවුලයක ස්කන්ධය සොයන්න.

14. $H_2O$ වල 360gක ඇති $H_2O$ අණු මවුල සංඛ්‍යාව සොයන්න (H = 1, O = 16) $n = m/M$ යන ප්‍රකාශනය භාවිත කරන්න.

15. i) යූරියාවල [ $CO(NH_2)_2$ ] සාපේක්ෂ අණුක ස්කන්ධය සොයන්න. (C=12, O=16, N=14, H=1)

ii) යූරියාවල මවුලික ස්කන්ධය කොපමණද?

iii) යූරියාවල 120gක අඩංගුවන යූරියා අණු සංඛ්‍යාව සොයන්න.